**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය සංරචකය - 2019**

---

**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය ආකෘතිය යටතේ සංරචකයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය සහ ව්‍යාපෘතියේ කාලය**

---

**ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයවීමේ නියෝජිත ආයතනය වේ. ශ්‍රී ලංකාව තුළ ක්ෂය රෝග මර්දනය කිරීමේ වැඩ සටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්ෂය රෝග නව මූල්‍යයනය ආකෘතිය නමින් ක්ෂය රෝග සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 404.89 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 2.588 ක් වන අතර එය ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව පිළිබඳ ගෝලීය අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

**මෙම වාර්තාවේ 2 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතික වීමක් වන**

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද ,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ගෝලීය අරමුදල මගින් උපකරණ ප්‍රසම්පාදනය සඳහා සෘජුව ලබාදී තිබුණු ප්‍රදානයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මුදල් පදනමද උපචිත පදනමද යන්න මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගෝලීය අරමුදල මගින් ලබාදී තිබුණු ප්‍රදානයන් අඩුවෙන් දැක්වීමේ හෝ වැඩියෙන් දැක්වීමේ අවදානම පැවතීම. | මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයට මෙන්ම ගෝලීය අරමුදලට වාර්තා කරනු ලබයි. ගෝලීය අරමුදලෙහි වාර්තාකරණ අවශ්‍යතාවය වර්ෂයකට එක් වතාවකි. ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ හා විසර්ජනය සඳහා ඉල්ලීම් කිරීමේ ආකෘතිය (Progress Update and Disbursement | උපකරණ ප්‍රසම්පාදනය සඳහා ලැබෙන සෘජු ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | Request) (PUDR) මෙහි ප්‍රධාන වාර්තා කිරීමේ ආකෘතිය වේ. මෙය මුදල් පදනම මත හා ගෝලීය අරමුදලෙහි මාර්ගෝපදේශයෙහි දැක්වෙන ආකෘතියට අනුව සිදු කරනු ලබයි. බාහිර මූල්‍ය ප්‍රකාශනය විගණකවරුන් සඳහා නිකුත් කරනු ලබන අතර එය විගණනය කරන ලද උපචිත පදනම මත වාර්තා කරනු ලැබේ. (ගෝලීය අරමුදලෙහි මාර්ගෝපදේශය (GF Guidelines අනුව) මේ හේතුවෙන් එම මුදල් ප්‍රමාණ දෙක අතර වෙනසක් පවතී. |

**2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලා ඒම් සහ මුදල් පිටතට ගලා යාම් දක්වා නොතිබුණු බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා වලට අනුකූල නොවීම. | මෙය සටහන් කරගෙන තිබෙන අතර එය පිළිපදිනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කළ යුතුය. |

**2.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| රු.මිලියන 202 ක වටිනාකමින් යුත් ජර්නල් සටහන් 8 ක් මඟින් මූල්‍ය ප්‍රකාශන සඳහා ගැලපීම් කර තිබුණු නමුත් එම ජර්නල් සටහන් වගකිවයුතු නිලධාරියෙකු විසින් අනුමතකර නොතිබුණු අතර ඒවා ලෙජර් ගිණුම්වල ද සටහන් කර නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය | සාවද්‍ය ජර්නල් සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශන මෙහෙය විය හැක. | විදේශීය විගණනය (ගෝලීය අරමුදලෙහි විගණනය) මගින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය විසින් සාමාන්‍යයෙන් අවසන් ජර්නල් සටහන් සම්මත කරගනු ලබයි. 2019 වර්ෂයෙහි මූල්‍ය කාල සීමාවේදී, ගෝලීය අරමුදලෙහි විගණනය 2021 පෙබරවාරි 21 වන දින අවසන් විය. විගණනයෙහි ප්‍රමාදය හේතුවෙන් හා 2019 වර්ෂයෙහි ගෝලීය අරමුදලෙහි විගණනය අවසන් වීමට පෙර, | ජර්නල් සටහන් පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් ලෙජර් ගිණුම් සමඟ නොසැඳුණි. | | අත්සන ලබා ගැනීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් මූල්‍ය ප්‍රකාශන අමාත්‍යාංශය වෙත යවා තිබුණි. ඉන්පසු එය මෙරට විගණනය වෙත ඉදිරිපත්කරනු ලබයි. එම හේතුව නිසා මෙම ගැටළුව පැන නැගී තිබුණි. | |

**2.4** නොසැසඳු ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සටහන **05** අනුව, වර්ෂය තුළ තථ්‍ය වියදම රු.**122,042,011** ක් ලෙස පැවති අතර සටහන **10.1** අනුව මහා භාණ්ඩාගාරයෙන් සිදු කරන ලද තථ්‍ය අරමුදල් හුවමාරුව රු.**122,002,259** ක් ලෙස දැක්විණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු.**39,752** ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සංසන්දනය කිරීමේ හැකියාව නොපැවතීම. | මෙය යතුරුලියන දෝෂයක් වන අතර මෙම දෝෂය **2020** මූල්‍ය ප්‍රකාශනයෙහි නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්හි නිරවද්‍යතාවය, විගණනය වෙත ඉදිරිපත් කිරීමට පෙර පරීක්ෂා කළ යුතුය. |
| (ආ) | **2019** ජනවාරි **1** වන දින ඉදිරියට ගෙන එන ලද ගෙවිය යුතු මුදල රු.**95,023,956** ක් ලෙස දැක්වුණු අතර පෙර වර්ෂයේ අවසන් ශේෂයෙහි විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව එම ගනුදෙනු අයිතමය රු.**95,897,409** ක් විය. ආරම්භක ශේෂය හා පෙර වර්ෂයෙහි අවසන් ශේෂය අතර වෙනස වූ රු.**873,453** සසඳා නොතිබුණි. | ආරම්භක ශේෂය හැසිරවීමේ අවදානම පැවතීම. | සටහන් කරගෙන ඇත. | ආරම්භක ශේෂයන් පෙර වර්ෂයෙහි ශේෂයන් හා සැසඳීම සිදු කළ යුතුය. |

**2.5** විගණනය සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 වර්ෂය සඳහා වියදම් නොකරන ලද බැඳීම් සහිත බැරකම්වලින් සමාලෝචිත වර්ෂයේදී කපා හරින ලද රු.3,670,594 ක මුදල සඳහා ව්‍යාපෘති කාර්යාලය මගින් ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි සපයා නොතිබුණි. | ව්‍යාපෘතියේ පවතින ශේෂයන් කපා හැරීමේ අවදානම පැවතීම. | සටහන් කරගෙන ඇත. ගිණුම්කරණ පද්ධතියෙන් 2014/2015/2016 වර්ෂ වලදී රු.3,670,594 ක් පැවත එන අතර, නව සමාගමක් ඇති කිරීම තුළින් ව්‍යාපෘතිය විසින් 2019- 2021 කාල සීමාව සඳහා ගනුදෙනු වලට එළඹීම ආරම්භ කිරීම සිදු කරනු ලැබූ අතර 2019-2021 කාල සීමාව තුළ උපකල්පනය මත පදනම්ව ගෝලීය අරමුදල විසින් පෙර ප්‍රදාන බැඳීම් ගෙවීම සිදු නොකරනු ඇත. නව බැඳීම් සඳහා ගැලපීම් කිරීමට එම ප්‍රමාණය කපා හැරීමට තීරණය කරනු ලැබුණි. (2019 - 2021) | ශේෂයන් කපා හැරීමට පෙර පැහැදිලිව හඳුනාගත යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු වල භෞතික කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 461.68 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.951 ක් ව්‍යාපෘති කාල සීමාව තුළ උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණද, රු.මිලියන 122 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.682 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 5.25 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.029 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ආපසු ගෙවා තිබුණි. | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම හා ප්‍රතිපාදන කාලීනව උපයෝජනය කෙරෙහි අවදානමක් පැවතීම | සටහන් කරගෙන ඇත. | ප්‍රතිපාදන කාලීනව උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියෙහි වැය විෂය ක්‍රියාකාරකම් එකොළහක් (Budget line activities) යටතේ සලසන ලද මුළු ප්‍රතිපාදනය වූ එ.ජ.ඩො.203,801කට සමාන රු.31,884,431 ක් අපේක්ෂිත කටයුතු වලට උපයෝජනය | අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම කෙරෙහි අවදානමක් පැවතීම | සටහන් කරගෙන ඇත. සාමාන්‍යයෙන් ව්‍යාපෘතිය විසින් වියදම් නොකරන ලද පවතින වැය විෂය අංක (Budget line) අවසානයේදී නැවත ඇස්තමේන්තු කිරීම සිදු කරනු ලබයි. මෙම වියදම් | අරමුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉතිරිවී තිබුණි. | | නොකරන ලද වැය විෂය අංක (BL) නැවත සැලකීම ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ හා විසර්ජනය කිරීමේ ඉල්ලීම් (PUDR) මගින් සිදුකරන අතර, ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ හා විසර්ජනය කිරීමේ ඉල්ලීම (PUDR) වෙත මෙම ප්‍රමාණය 2019 වර්ෂයේදී නැවත ප්‍රතිපාදනය කර ඇති අතර, එය 2020 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබිණි. | |
| (ඇ) | අයවැය ගත පිරිවැය කාණ්ඩ 12 ක් යටතේ වැය විෂය ක්‍රියාකාරකම් 92 ක් (Budget line activities) ව්‍යාපෘති කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවතුණි. කෙසේ වෙතත් රු.මිලියන 46.3 කට සමාන එ.ජ.ඩො.295,941 ක් වැය විෂය ක්‍රියාකාරකම් 24 ක් යටතේ වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉන් රු. මිලියන 18.72 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 104,343 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වැය විෂය අංක 21 (Budget line No.21) යටතේ සිදුකරන ලද රු.මිලියන 0.734 කට සමාන එ.ජ.ඩො. 4,693 ක වෙන්කිරීම් ඉක්මවමින් ව්‍යාපෘතිය විසින් හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා වෙනත් දිස්ත්‍රික් මට්ටමේ රෝහල් කාර්ය මණ්ඩල සේවා පුහුණුව සඳහා රු. මිලියන 1.392 කට සමාන එ.ජ.ඩොලර් 7,788 ක් වැයකර තිබුණි. | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි හා ප්‍රතිපාදන කාලීනව උපයෝජනය කිරීම කෙරෙහි අවදානමක් පැවතීම. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතියෙහි කටයුතු අයවැය ලේඛණය සමඟ සමගාමීවන බව තහවුරු කිරීමට ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය අඛණ්ඩව කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතිය විසින් 2008 වර්ෂයේ සිට රු.මිලියන 523.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.888 කට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතියෙහි ස්ථාවර වත්කම් වල පාලනය දුර්වල වීමේ හැකියාව පවතී. | සටහන් කර ගෙන ඇත. | භෞතික සත්‍යාපනය අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |